ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82

දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා
නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2569 2025 ඔක්තෝබර් 06 වප් කලාපය

**ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරය ප්‍රමුඛ අෂ්ඨ මහා විහාරාධිපති,
දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති,
කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

## "සිතේ තරම"

**"චිත්තේන නීයති ලෝකෝ - චිත්තේන පරිකස්සාති
චිත්තස්ස එකධම්මස්ස - සබ්බේ'ව වසමන්වගූ"**

**(සංයුක්ත නිකාය, දේවතා සංයුක්ත, චිත්ත සූත්‍රය)**

සුපින්වතුනි,

ඔබ අප කාටවත් නොපෙනෙන දෙයක් තමයි අද මං මාතෘකාව වශයෙන් තබා ගත්තේ. නොපෙනුනා කියල මේක පැත්තකට දමන්න බැහැ. නිවන් දකින්න නම් මේක දකින්නම ඕන. අපේ මනසට මේක පෙන්නේ නැහැ. විදර්ශනා නුවණට තමයි පෙන්නේ. විදර්ශනා නුවණ කියන්නේ මොකක්ද? අපට පැහැදිලිව නොපෙනෙන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය දකින්න පුළුවන්. නුවණ විදර්ශනා නුවණ ලෙස හඳුන්වන්න පුළුවන්. දැන් මේ විදර්ශනා නුවණින් ත්‍රිලක්ෂණය දකින්න ඕන කුමක්ද? ඒක තමයි අපේ සිත. අද මාතෘකාව මේ සිත ගැනයි. සිත ගැන ඔක්කොම මෙතනදී කියාදෙන්න බැහැ. සිතෙන් කෙරෙන ප්‍රධාන කටයුත්තක් ගැනයි අද ඔබට කියාදෙන්න සූදානම් වෙන්නේ.

මේ සිතට වාහන ඕන නෑ. ඕනෑ දුරක් යන්න පුළුවන්. ඒ සඳහා අසුරක් ගසන තරම් කාලයක් වත් ගත වෙන්නේ නැහැ. (=දූරංගමං), ඒ වගේම මේ සිතට ඒ දුර ගමන් තනියම යන්න පුළුවන්. අපට තමයි තව කෙනෙකු අවශ්‍ය වෙන්නේ. සිතට කවුරුත් ඕන නැහැ.(= ඒකචරං), ඇහැට පේන්න ශරීරයකුත් නැහැ.(අසරීරං), හැංගිලා ඉන්නේ. (=ගුහාසයං) මෙන්න මේ සිත ගැන නිවැරදිව තේරුම් ගත් මෙතෙක් ලොව පහළ වූ ශ්‍රේෂ්ඨ මනෝවිද්‍යාඥයා ගෞතම බුදුරජාණන්වහන්සේ.

නිදහසේ ගසින් ගසට යමින් කැමති කැමති පලවැල කොළ කන වඳුරෙකු වගේ මේ සිත අරමුණෙන් අරමුණට යන බව මහා තණ්හා සංඛය සූත්‍රයේදී දේශනා කරලා තියෙනවා. පුද්ගලයා ක්‍රියාවට මෙහෙය වන්නේ සිතයි. මේ සිත වේදනා, සඤ්ඤා, සංඛාර, යන ප්‍රධාන අංශ තුන යටතේ ක්‍රියාත්මක වෙනවා. එබඳු සිත ගැන පටිච්ච සමුප්පාදය අනුව බුදුහාමුදුරුවෝ පැහැදිලි කරලා දීලා තියෙනවා. මේ සිත හොඳ පැත්තට හැරුණොත් සද්ධා, විරිය ආදී හොඳ යාළුවො එයාට ඉන්නව. නරක පැත්තට හැරුණොත් තණ්හා මාන ආදී නරක යාළුවො එයාට ඉන්නවා. මේ සිතට සේවකයෝ සය දෙනෙක් ඉන්නවා. ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන නම්වලින් ඔවුන් හඳුන්වනවා. පළමුවැනි සේවකයා වන ඇසට රූපයක් හමු වුණාම ඔහු ඒක තමාගේ ස්වාමියා වන සිතට ඉදිරිපත් කරනවා. සිත ඒකට කැමති නම් 'කය' නමැති සේවකයාට උපදෙස් දෙනවා. සිතේ කැමැත්ත ඉෂ්ට කර ගැනීමට අවශ්‍ය කටයුතු පිළියෙළ කරන්න කියල.

අපි හිතමු නාට්‍යක දැන්වීමක් ඇසට පෙනුණා කියල. ඇස ඒ පණිවිඩය හිතට දෙනවා. ඊට පස්සේ හිත කයට අණ දෙනවා.සල්ලි තියේද බලපන් කියල පොකැට්ටුව අවුස්සවනවා. මුහුණ ඇඟපත සෝදාගනින්, මැදපු රෙදිටික හැඳගනින්, පාරට යමන්, බසයට නැගපන්, නාට්‍ය ශාලාව ළඟ බැහැපන්, ටිකට් අරගනින් ආසනයක වාඩිවෙයන්, නාට්‍යය බලපන්, ඔන්න ඒ අතරෙ 'කන'නමැති සේවකයාට කියනව අර දෙබස්, ගීත අහගනින් කියල. ඔය විදියට නාට්‍යය බලවලා ආපසු ගෙදරට එක්කගෙන එනවා. ශරීරය රූකඩයක් වගේ සිත නටවන නූල අනුව කියන දේ කරනවා. කයත්, කනත් තමන්ට පැවරුණ වැඩේ කරල සිත නමැති ස්වාමියා සතුටු කරනවා.

නාට්‍යය බලා ඉවර වුණාට පස්සේ, ළඟම තියෙන හෝටලයකට යමු කියල 'කය' නමැති සේවකයාට කියනවා. රස කෑම ගෙන්න කියල වේටර්වරුන්ට කියනවා. දිව නමැති සේවකයා ඒ කෑම වලට රස ගුණ කියනවා. අන්තිමට මේ ඔක්කොම තොරතුරු ටික 'මනස' නමැති සේවකයාට දෙනවා ආයෙත් ඕන වුණාම ගන්න, පරිස්සම් කරලා තියාගන්න කියල. රෑට නිදාගන්න ගියාම මනස නමැති සේවකයා අර තොරතුරු ටික හිතට ගෙනැල්ල දෙනවා.

අප අවදියෙන් ඉන්න හැම වෙලාවේම මේ සේවකයො හය දෙනා වැඩ කරනවා. අපේ සිත ඔවුන් මෙහෙයවනවා. (-චිත්තේන නීයති ලෝකෝ) මෙන්න මේ විදියට බුදු දහමේ බොහෝ තැන්වල ලෝකය කියා කියන්නේ අපේ සිත අපට හදල දෙන මේ සංකල්ප ලෝකයටයි. ඒක අපේ හිතෙන් අපට මවා දීපු එකක්.

.සැබෑ ලෝකය බැලුවොත් සතර මහා ධාතූන්ගෙන් හා වණ්ණ, ගන්ධ,රස,ඕජා යන මේවායෙන් සකස් වුණු නිතර වෙනස් වන රූප ගොඩවල් ටිකක් විතරයි තියෙන්නේ. ඒ ඒ රූපවල හැඩය අනුව අපි ඒවාට ගෙය, වාහනය, අම්මා, තාත්තා, පුතා, දුව, සල්ලි, රත්තරන්, ආදී වශයෙන් නම් දාගෙන එක්කෝ ඒවාට ඇලෙනවා. නැත්තම් ඒවා සමග ගැටෙනවා. නිවන් දකින්න නම්, ඇලීම් ගැටීම් දෙක දුරු කරන්න ඕන. (විනෙයාය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං) එහෙත් ඇත්තටම ඒවා තියෙනවා. ඒවා පරිහරණය කරන 'මම ඉන්නවා'කියල අපට හිතෙනවා. ඒක තමයි අවිද්‍යාව කියන්නෙ.

සතර මහා ධාතු අඩු වැඩි වශයෙන් විවිධ හැඩයට එකතු වෙලා හැදුණු රූප ගොඩක් විතරයි තියෙන්නේ අපේ හිත ඒ රූප අතරින් ලස්සන දේවල් මෙන්න මේවා කියල පෙන්වනවා.මිහිරි ශබ්ද මෙන්න මේව කියල අහන්න සලස්වනවා. ඒ පෙන්නපු ලස්සන ඒ බාහිර රූපයේ නැහැ. ඒ පෙන්නපු මිහිරි බව ඒ බාහිර ශබ්දයේ නැහැ.ඒ ඔක්කොම අපේ හිත අපට මවා දීපු දේවල් ඒ බව බුදුහාමුදුරුවෝ මෙසේ දේශනා කරලා තියෙනවා.

"න තේ කාමා යානි චිත්‍රාණි ලෝකේ සංකප්ප රාගෝ පුරිසස්ස කාමෝ
තිට්ඨන්ති චිත්‍රාණි තථේව ලෝකේ අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං"

අපේ හිත තමන්ගේ ළඟ තියෙන ලස්සන කියන සංකල්පය, මිහිරි කියන සංකල්පය, සනීපය කියන සංකල්පය, අර රූපවලට දමල අපට පෙන්වනවා. අපි හිතනව ඒ ලස්සන, මිහිරි, සනීපය අර රූපවල තියෙනවා කියල. හිත තමන්ට සතුටුවෙන්න තමයි බාහිර රූපවල නැති ලස්සනක්, නැති මිහිරක්, නැති සනීපයක් ඒවායෙහි තියෙනවා කියල අපට පෙන්වන්නේ. ඇත්තටම බැලුවොත් මේක මායාවක්.

අපි කැමති වන රූප ශබ්ද ආදිය මස් ලේ නැති ඇට කැබැල්ලක් වගෙයි. (= අට්ඨිකංකලූපමා කාමා), දකින දකින අය ආස කරන, අපෙන් උදුරාගන්න මස් කැටියක් වගෙයි. (=මංස පේසූපමා කාමා), අපේ සිතත් ගතත් රාග, ද්වේශ, ආදී ගිනිවලින් දවන තවන නිසා ඇවිලතත් තණ සුලක් වගෙයි. (=තිණුක්කූපමා කාමා), කාමයන් අල්ලා ගත්තොත් ඒ බැඳීම තියෙන තුරු අපේ සිත ගිනි ගන්නවා ආසාව නිසා ළං කර ගත්තත් එකෙන්ම අපේ විනාශය සිදු වෙනවා. මේ නිසා කාමයන් ගිනි අඟුරු වළක් වගෙයි. (=අංගාරකාසූපමා කාමා)

ලස්සන හීනයක් දැකලා අවදි වුණාට පස්සේ ඒ කිසිවක් තමන් ළඟ නැතුවා වගේ කාමයන් හීනයක් වගෙයි. කාමයන්ගෙන් ලබන සතුට තියෙන්නේ ඒ වෙලාවට පමණයි. ඒ නිසා නැවත නැවත සතුට සොයනවා.(= සුපිණකූපමා කාමා) අනුන්ගෙන් ඉල්ලා ගත් රෙදි, ආභරණ හැඳ පැළඳගෙන යන තැනැත්තා ඒ වේලාවට පොහොසතකු වගේ පේනවා. අයිතිකාරයෝ ඔවුන් දුන්න දේවල් ආපසු ඉල්ලා ගත්තම අර පුද්ගලයාට මොකුත්ම නැහැ. ටික කලකින් නැතිවෙලා යන නිසා කාම වස්තූන් යනු අනුන්ගෙන් ඉල්ලා ගත්ත දෙයක් වගෙයි (=යාචිතාකූපමා කාමා), යනුවෙන් මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේ සඳහන් කරලා තියෙනවා.

.ඒ නිසා අපේ හිත අපට මවා පෙන්වන මේ සංකල්ප ලෝකයේ ආස්වාදයක් තියෙනවනම් ඒක ඒ මොහොතට විතරයි. ඊට පස්සේ දුකම තමයි. (=අප්පස්සාදා කාමා බහු දුක්ඛා බහුපායාසා ආදීනවෝ සත්ථ භියෝ) හිත සිදුකරන මේ වැඩපිළිවෙළට 'පංච උපාදානස්කන්ධ ලෝකය' කියල කියනවා. මේ ලෝකයේ හටගන්නා ආකාරය මධුපිණ්ඩික සූත්‍රයේදී පැහැදිලිව දේශනා කරලා තියෙනව. ඒ අනුව ඇස, කන ආදී අභ්‍යන්තර ආයතන සයත්, රූප ශබ්ද ආදී බාහිර ආයතන සයත් ඇසුරින් අපේ සිතේ ඇතිවන රූප සංකල්පය ටික රූප ස්කන්ධයයි. ඒ රූපාදී අරමුණ ලද බව දැනගැනීම නමැති චක්ඛු විඤ්ඤාණ ආදීය විඤ්ඤාණ ස්කන්ධයයි. අරමුණ හේතු කරගෙන ඇතිවුණු ස්පර්ශය විඳින ගතිය වේදනා ස්කන්ධයයි. ඒ වේදනාව සුඛ දුක්ඛ ආදී වශයෙන් හඳුනා ගන්නා ස්වභාවය සඤ්ඤා ස්කන්ධයයි හඳුනාගත් වේදනාව අනුව සිතන ගතිය හෙවත් චේතනා චෛතසික ඇතුළු අනෙක් සිතිවිලි සංඛාර ස්කන්ධයයි. මේ පංච උපාදාන ස්කන්ධ නමැති ලෝකය සිතෙන් හදල දෙනවා.(=නියති) උපතේ සිට මරණය දක්වා මේ ලෝකය ඇදගෙන යනවා (=පරිකස්සති) මේ ඔක්කොම සිතේ වසඟයට පත්වෙලා. (=චිත්තස්ස ඒකධම්මස්ස-සබ්බේව වසමන්වගූ)

අපේ සිත කැමති දේවල් වගේම අකමැති දේවලුත් අල්ලා ගන්නවා. අකමැති දේ අල්ලගන්නේ කොහොමද කියල ඔබ සිතනවා ඇති. හිතෙන් ඒවා අල්ලාගන්නා නිසා තමයි ඒවා සමග ගැටී ගැටී ඉන්නේ. ඒවා අත්හැරියා නම් ගැටෙන්න දෙයක් නැහැනේ. අල්ලාගෙන ඉන්න නිසා තමයි ගැටෙන්නේ.

ඔය විදියට අෂ්ට ලෝක ධර්මය ම අපේ සිතින් අල්ලාගෙන තියෙන්නේ. එහෙම අල්ලගන්න නිසා තමයි කලින් කීව විදියට රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංච උපාදාන ස්කන්ධය ඇතිවෙන්නේ උපාදාන කියන්නේ අල්ලාගැනීමට කියන තවත් නමක්.

මේ ස්කන්ධ පහ ක්‍රියාත්මක වෙන කොට "මම" කියල කෙනෙක් ඉන්නවා කියල අපට හිතෙන්නේ. 'මම' කියා වෙනත් කෙනෙක් නැහැ. මේ පංච උපාදානස්කන්ධ තමයි 'මම' කියල පෙනෙන්නේ, දැනෙන්නේ, හිතෙන්නේ, 'මම' කියන්නේ හැඟීමක් විතරයි. ඒ හැඟීම කොයිතරම් බලවත්ද කියනවනම්, දීර්ඝ සංසාරයේ සත්වයා අරගෙන යන්න ඒ හැඟීමට පුළුවන්. සුගතියේ සැප දකින්නෙත් දුගතියේ දුක දකින්නෙත් අපේ සිතම තමයි. අපට ඒක නොතේරන නිසා සැපයට කැමති වෙනවා. දුකට අකමැති වෙනවා.අපට සැප කියා පෙනේනෙත් දුකට තමයි. ඒවායින් ජාති, ජරා, ව්‍යාධි මරණ ආදී දුක් උපදිනවා. බුදුවරු චතුරාර්ය සත්‍ය දේශනාව මගින් මේ බව අපට කියල දෙනවා.

ත්‍රිවිධ භවයෙන් කොතැනක උපන්නත් මේ දුකින් ගැලවෙන්න බැහැ. ඒ හැමතැනකම අල්ලා ගැනීම (=උපාදාන) තියෙනවා. ඉන්ද්‍රිය ගෝචර ලෝකය සිතෙන් අල්ලා ගන්නේ නැති නම් සසර නැති වෙනවා. අෂ්ට ලෝක ධර්මයම නැතිවෙනවා. කයින් අත්හැරීම වස්තුකාමයෙන් වෙන්වීමයි. සිතින් අත්හැරීම ක්ලේශ කාමයෙන් වෙන්වීමයි. ලෝකයේ ඇත්ත තේරුම් ගෙන නිවන් දැකීමට ඔබ සැමදෙනාටම හැකිවේවා!

ඔබ සැමට තෙරුවන් සරණයි!